# ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ තනතුර

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා යථා පරිදි සුදුසුකම්ලත් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ, එම ආයතනයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර ඔහු/ ඇය ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ආයතනයේ ප්‍රධාන අධ්‍යයන හා ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු/ ඇය ආයතනය තුළ විනය පවත්වා ගැනීමේ වගකීම දරයි. ඔහු/ ඇය නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක් හා සභාපති ද වේ.

අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් කරන අයදුම්කරු හෝ නාමික අධ්‍යයන කුසලතා හා අවංකභාවයෙන් යුක්ත අයෙකු වීම අපේක්ෂා කරන අතර ඔහු/ ඇය පර්යේෂණ ප්‍රකාශන ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වය, නායකත්ව කුසලතා සහ අන්තර්පුද්ගල කුසලතාවයන්ගෙන් යුක්ත විය යුතු මෙන්ම ප්‍රතිපත්ති ගැටළු සම්බන්ධයෙන් පැහැදිලි අර්ථාවබෝධයක් ඇති අයෙකු විය යුතුය.

**1. සුදුසුකම්**

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධියක් (MD/MS) හෝ ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ජාන තාක්ෂණ විද්‍යාව, ප්‍රතිශක්ති වේද විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ජාන තාක්ෂණ විද්‍යාව, ප්‍රතිශක්තිවේද විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයක පරිපාලන පළපුරුද්ද තිබීම අමතර වාසියකි.

**2. වයස**

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට අයදුම්කරු වයස අවුරුදු 63ට නොඉක්මවිය යුතුයි.

**3. වැටුප් කේතය**

Rs. 117,350-13 x 2,700-152, 450 p.m. U -AC 5 (II) සහ තනතුරට අදාළ අනෙකුත් දීමනා විශ්වවිද්‍යාල පනතෙහි නිර්වචනය කර ඇති පරිදි අයදුම්කරු විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් නම් හා ඉහත වැටුපට වඩා වැඩි වැටුපක් ලබන්නේ නම්, ඔහු/ඇය දැනට ලබන වැටුප් තලයේ පිහිටුවමින්, අධ්‍යයන දීමනාව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

**සැයු :** දැනට රජයේ සේවයේ නියුතු හා ඉහත මූලික වැටුප් ප්‍රමාණයට වඩා වැඩි වැටුපක් ලබන අය දැනට ඔහු /ඇය ලබන වැටුපට සමාන වැටුප් තලයක පිහිටුවනු ඇත.

**4. තනතුරු කාලය**

පත්වීම ලබන දින සිට වසර තුනක් (03) හෝ ඔහු/ඇය වයස අවුරුදු හැටපහ (65) සම්පූර්ණ කිරීම යන දෙකෙන් පළමුව එළඹෙන දිනෙන් පත්වීම කාලය අවසන් වේ.

**5. වෙනත් ප්‍රතිලාභ**

i) නිල ප්‍රවාහන පහසුකම්

ii) සංග්‍රහ දීමනාව

iii) විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් දායකත්වය

iv) සේවක භාරකාර අරමුදල් දායකත්වය

**6. අයදුම්පත් භාරදීම**

අපේක්ෂිත අයදුම්කරුවන් විසින් තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය, අංක 90, කුමාරතුංග මුනිදස මාවත, කොළඹ 03** යන ලිපිනයට **2024 පෙබරවාරි 27** වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අයදුම්කරුවන් විසින් අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත** යනුවෙන් සඳහන් කළ යුතුය.

**අයදුම්පත්/ නාමයෝජනා සමග පහත සඳහන් ලේඛන එවිය යුතුය.**

1. අයදුම්කරුගේ/ නාමිකගේ උපන්දිනයද (සහතික කළ උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබීම අනිවාර්යය වේ) ඇතුළත් සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාවක් (සනාථ කිරීම සඳහා අවශ්‍ය සහතික පිටපත් ද සමග)
2. ආයතනයේ සංවර්ධනය පිළිබඳව දැක්ම ඇතුළත් ප්‍රකාශයක්
3. දැනට සේවයේ නියුතු අධ්‍යක්ෂවරයා අයදුම් කරන්නේ නම් ඔහු/ ඇය විසින් ඉහත අංක 02 යටතේ සඳහන් සංවර්ධිත දැක්ම පිළිබඳව ප්‍රකාශය ද සමග ඔහුගේ/ ඇයගේ පළමු පත්වීම කාලය තුළ ළඟා කරගත් සංවර්ධනය සහ ජයග්‍රහණ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
4. අධ්‍යක්ෂ තනතුරට පත් වුවහොත් ඔහු/ඇය විසින් ළඟා කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක හා සැලසුම් පිළිබඳ ලුහුඬු වාර්තාවක්
5. නාම යෝජනාවක් නම්, අදාළ නම් කිරීම සඳහා නාමිකගේ කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක්
6. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතිකවල සහතික කළ පිටපත් සමග නායකත්ව සුදුසුකම්, පර්යේෂණ ප්‍රකාශන, ලද ඇගයීම් හා පරිපාලනමය දක්ෂතාවලට අදාළ සහතික පිටපත්

එයට අමතරව ඉහත ලේඛනවල මෘදු පිටපතක් අනෙකුත් සහයක ඇමුණුම් ද සහිතව PDF ආකෘතියෙන් සකස් කොට විද්‍යුත් තැපැල් මාර්ගයෙන් vacancies@ibmbb.cmb.ac.lk යන ලිපිනයට 2024 පෙබරවාරි 27 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ විද්‍යුත් තැපැල් පණිවිඩයෙහි විෂය වශයෙන් අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල හෝ රාජ්‍ය අංශයේ, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

අසම්පූර්ණ, අපැහැදිලි හෝ ඉහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොකරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, අංක 90, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.**
**2024.01.28**